# කාව්‍යමය භාෂා ශෛලියකින් ලියැවුණු සිංහල ශිලාලේඛන

Sinhalese Inscriptions written in a poetic language

ආචාර්ය මොරකන්දේගොඩ අරියවංස හිමි

## Abstract

The purpose of an inscription is to state very briefly the report to be told. There were various reasons for it. It is a very difficult task to prepare a stone slab, a stone pillar or a rock in a suitable shape to write inscriptions. It is inconceivable that poetic prose compositions containing nonsense and boasting could be written on a stone prepared in such a way. Similarly, works with high praises are found in abundance in verse rather than prose. There are several inscriptions written in verse form in Sinhalese, but they are not perfect in lyrical and poetic aspects. However, inscriptions written in a poetic language style with lengthy praises are found here and there in Sri Lanka. They are as follows: Jētəvanārāmə inscription of IV Mihiňdu, Am̆bəgamuvə rock inscription of I Vijəyəbāhu, Miɳipē slab inscription, Kirində pillar inscription of Epā Mihiňdu, Tōpā Vævə inscription, Dēvə Prətirājə slab inscription, Polonnaru pillar inscription of V Mihiňdu, Sagəmə rock inscription, and Koɳɖəvaʈʈəvan pillar inscription. The research problem here is to inquire whether there are inscriptions written in a poetic language pattern among the Sinhalese inscriptions. This article is written under the qualitative research method by taking the compilations of inscriptions made by Senarath Paranavithana and other scholars as primary sources and the related research books, journals etc. as secondary sources. Sinhalese people of Sri Lanka recorded the information about the donations they had made on a stone with a simple language in the early stage of our

history. But in the later period they used literary exaggerated and figurative language to inscribe their ideas on a stone. Because of that, we can make it clear that there is a poetic language style on several inscriptions written in Sri Lanka.

**Keywords:-** Inscriptions, Pillar Inscriptions, Poetic Language, Rock Inscriptions, Slab Inscriptions

**සාර සංක්ෂේපය**

ශිලාලේඛනයක පරමාර්ථය වනුයේ පැවසිය යුතු වාර්තාව ඉතා කෙටියෙන් දැක්වීම යි. ඊට විවිධ හේතු ද බලපෑවේ ය. ශිලාලේඛනයක් ලිවීමට තරම් සුදුසු ආකාරයෙන් ගල්පුවරුවක්, ගල්ටැඹක් හෝ ගල්කුලක් සකස් කර ගැනීම අතිදුෂ්කර වූ කාර්යයකි. එසේ සකසා ගත් ගල් පුවරුවක වැල්වටාරම් හා පුරසාරම් අන්තර්ගත කාව්‍යාත්මක ගද්‍ය රචනා ලියනු ඇතැයි සිතිය නො හැකි ය. එසේ ම වර්ණනා බාහුල්‍යයෙන් යුක්ත නිර්මාණ බෙහෙවින් හමුවනුයේ ගද්‍යයේ දී නො ව පද්‍යයේ දී ය. පද්‍යමය ආකෘතියෙන් රචිත සෙල්ලිපි කිහිපයක් සිංහලයේ ඇති නමුත් ඒවා පවා ගීතවත් හා කාව්‍යමය අංශයන්ගෙන් පරිපූර්ණ වූවේ නො වේ. කෙසේ නමුත් දීර්ඝ වර්ණනාවන්ගෙන් යුක්ත, කාව්‍යාත්මක භාෂා ශෛලියකින් රචිත සෙල්ලිපි ලක්දිව තන්හි තන්හි දක්නට ලැබේ. ඒවා අතර IV මිහිඳුගේ ජේතවනාරාම ලිපිය, I විජයබාහුගේ අඹගමුව පර්වත ලිපිය, මිණිපේ පුවරු ලිපිය, ඇපා මිහිඳුගේ කිරින්ද ටැම් ලිපිය, තෝපා වැවේ වාන් ඇළ ලිපිය, දේව ප්‍රතිරාජ පුවරු ලිපිය, V මිහිඳුගේ පොලොන්නරු ටැම් ලිපිය, සගම පර්වත ලිපිය හා කොණ්ඩවට්ටවන් ටැම් ලිපිය යනාදිය සුවිශේෂ ය. සිංහල ශිලාලේඛන අතර කාව්‍යාත්මක භාෂා රටාවකින් ලියැවුණු සෙල්ලිපි අන්තර්ගත ව ඇති දැයි විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි. සෙනරත් පරණවිතාන සූරීන් ප්‍රමුඛ පුරාවිද්‍යාඥයන් විසින් සම්පාදිත ශිලාලේඛන සංග්‍රහ ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් තදනුබද්ධ පර්යේෂණ ග්‍රන්ථ හා සඟරාදිය ද්වෛතීයික මූලාශ්‍රය ලෙසත් ගෙන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙකී ලිපිය රචනා කෙරේ. මුල් අවධියෙහි ලාංකික සිංහලයා සාටෝප, සාලංකාර භාෂා ව්‍යවහාරයට බර නො වී සරල, සුගම බස්වහරක් භාවිතයෙන් තමන් සිදු

කළ පරිත්‍යාගාදිය පිළිබඳ ව තොරතුරු ගල්පුවරුවක සටහන් කොට තැබූ බවත් පසු කාලීන ව සාහිත්‍ය රස පූර්ණ, අතිශයෝක්තියෙන් අනූන, ඕජෝගුණ සමන්විත, සාලංකෘත භාෂාත්මක වර්ණනයන්ට අනුගත වූ සෙල්ලිපි නිර්මාණය කළ බවත් පෙනී යයි. එම නිසා නිසල රුදු ගල්කුළෙක ජනහද සසල කළ හැකි සුලලිත පදමාලාවක් ගැබ් ව තිබෙන බව අපට පසක් කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ-** කාව්‍යාත්මක භාෂාව, ටැම් ලිපි, පර්වත ලිපි, පුවරු ලිපි, ශිලාලේඛන

## කාව්‍යමය භාෂා ශෛලියකින් ලියැවුණු සිංහල ශිලාලේඛන

### 1. හැඳින්වීම

'ශිලාලේඛන' යන වචනය සමඟ බැඳී පවතින ආකල්පය එතරම් සුඛනම්‍ය වූවක් නො වේ. එයට හේතුව සෙල්ලිපි කියවා තේරුම් ගැනීම වර්තමාන සාමාන්‍ය ජනයාට විෂයගෝචර නොවීම යි. බොහෝ විට අප සිතනුයේ සෙල්ලිපියක දැක්වෙන අදහස වැදගත් වනුයේ පුරාවිද්‍යාඥයාට හා ඉතිහාසඥයාට පමණක් බව යි. නමුත් මෙය සම්පූර්ණ සත්‍යය නො වේ. සමහර සෙල්ලිපියක අන්තර්ගත අදහස් මෙන් ම එහි බස් වහර ද බොහෝ දෙනාට ප්‍රයෝජනවත් වෙයි. විශේෂයෙන් ම භාෂාවක ආරම්භය, ප්‍රවර්ධනය හා කලින් කල එහි ඇති වන පරිණාමීය ලක්ෂණ අධ්‍යයනය කරන්නා වූ භාෂාවේදියකුට මේවා අතිශයින් ම වැදගත් වෙයි.

බොහෝ විට ශිලාලිපියක පරමාර්ථය වනුයේ පැවසිය යුතු වාර්තාව ඉතා කෙටියෙන් දැක්වීම යි. ඊට විවිධ හේතු ද නොතිබුණා නො වේ. ශිලාලේඛනයක් ලිවීමට තරම් උචිත වන ආකාරයෙන් ගල්පුවරුවක් හෝ ගල්ටැඹක් හෝ ගල් පර්වතයක මතුපිටක් හෝ සකස් කර ගැනීම අතිදුෂ්කර වූ කාර්යයකි. මෙකල ඒ සඳහා යන්ත්‍රෝපකරණ භාවිත වුව ද අතීත කාලයෙහි සරල ආයුධ කිහිපයක් හා මානවශ්‍රමය ම ඒ වෙනුවෙන් යොදා ගැනිණි. මෙසේ බොහෝ දුෂ්කරත්වයෙන් සකසා ගත් ගල් පුවරුවක අනවශ්‍ය දිගින් යුත් වැල්වටාරම් හා පුරසාරම් පිරි කාව්‍යාත්මක ගද්‍ය රචනා ලියනු ඇතැයි කෙනකුට සිතිය හැකි ද? එහෙත් මේ සියලු දුෂ්කරතා අමතක කර දමා, දීර්ඝ වර්ණනාවන්ගෙ

න් යුක්ත, කාව්‍යාත්මක භාෂා ශෛලියක් අනුගමනය කරමින් රචිත සෙල්ලිපි ද ලක්දිව තන්හි තන්හි දක්නට ලැබේ. විශේෂයෙන් ම එවන් ශිලාලේඛන බහුල ව දක්නට ලැබෙනුයේ රාජ්‍ය බලය යම් පමණකට හීන ව ගිය පාලකයන් වාසය කළ මධ්‍ය සිංහල අවධියේ (ක්‍රි. ව. 8 - 13 සි. ව.) දී ය. එකල රචනා වූ එවන් සෙල්ලිපි අතරින් කිහිපයක් කෙරේ විචාරක්ෂිය යොමු කිරීම මේ ලිපියෙන් අපේක්ෂිත ය.

**2. පර්යේෂණ ගැටලුව**

සිංහල ශිලාලේඛන අතර කාව්‍යාත්මක භාෂා රටාවකින් ලියැවුණු සෙල්ලිපි අන්තර්ගත ව ඇති දැයි විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

**3. පර්යේෂණයේ අරමුණු**

සිංහලයේ පවත්නා කාව්‍යමය ශිලාලේඛන පිළිබඳ අධ්‍යයනය කිරීමත්, එහි භාෂාත්මක විචිත්‍රතාව හා භාෂා යෝජනමය ඖචිත්‍යය විමර්ශනය කිරීමත් මේ පර්යේෂණයේ මුඛ්‍ය අරමුණු ය.

**4. පර්යේෂණයේ සුවිශේෂත්වය**

සිංහලයේ පවත්නා කාව්‍යමය ශිලාලේඛන පිළිබඳ විශේෂ අධ්‍යයනයක් හෝ ඒවායෙහි අන්තර්ගත භාෂාත්මක විචිත්‍රතාව හා භාෂා යෝජනයේ ඖචිත්‍යය විමර්ශනය කිරීමේ අරමුණ පෙරදැරි ව ම සිදු කෙරුණු පර්යේෂණයක් හෝ දක්නට නො ලැබේ. ඒ ඒ උගතුන් ඒ ඒ සෙල්ලිපි පිළිබඳ ශාස්ත්‍රීය විමර්ශන ඉදිරිපත් කරන අවස්ථාවන්හි දී කාව්‍යාත්මක භාෂාවෙන් රචිත ශිලාලේඛන සම්බන්ධයෙන් ද යම් ඇගයීමක් සිදු කොට ඇත. එහෙත් ඒවා මෙකී වර්ගයේ සෙල්ලිපි හඳුන්වා දීමේ හා විමර්ශනය කිරීමේ අරමුණින් ම නිර්මිත ඒවා නො වේ.

**5. සාහිත්‍ය විමර්ශනය**

ඩී. එම්. ද ඉෂෙඩ් වික්‍රමසිංහයන් විසින් 1912 දී සංස්කරණය කරන ලද Epigraphia Zeylanica, Vol-I ග්‍රන්ථයෙහි, V මහින්දගේ ජේතවනාරාම පුවරු ලිපිය ගැන තොරතුරු අන්තර්ගත වෙයි. මේ ලිපිය උපමා-රූපක බහුල කාව්‍යමය භාෂාවකින් රචනා කොට ඇති බව සඳහන් කොට ඇත. (213 පි.)

ඩී. එම්. ද ඉෂෙඩ් වික්‍රමසිංහයන් විසින් 1928 දී සංස්කරණය කරන ලද Epigraphia Zeylanica, Vol-II ග්‍රන්ථයෙහි, අඹගමුව පර්වත ලිපිය පිළිබඳ සෙනරත් පරණවිතාන ඉදිරිපත් කරන විග්‍රහයේ දී එහි භාෂා ශෛලිය හා පද රචනය එකල රචිත අනෙකුත් සෙල්ලිපිවල රටාවට (විශේෂයෙන් කාව්‍යමය භාෂාවකින් ලියැවී ඇති ජේතවනාරාම පුවරු ලිපියේ ශෛලියට) අනුගත ව ඇති බව පවසා තිබේ. (204 පි.)

එස්. පරණවිතාන විසින් 1955 දී සංස්කරණය කරන ලද Epigraphia Zeylanica, Vol-V, Part - I ග්‍රන්ථයෙහි, 12 සියවසට පමණ අයත් මිණිපේ ඇළ සෙල්ලිපියෙහි භාෂාව පොළොන්නරු - දඹදෙණි අවධීන්හි පැවති සංස්කෘත තත්සම බහුල භාෂා රටාවට වඩා නුමුසු හෙළ වදන් සහිත වෘත්තගන්ධී ශෛලියට අනුගත ව ලියැවී ඇති බව දැක්වෙයි. ඒ අනුව මෙහි ලා ‘දළදා සිරිත’ හා ‘කුවේණි අස්න’ යන ග්‍රන්ථයන්හි භාවිත වුණු භාෂා රටාව වැන්නක් අනුගමනය කර ඇති බව සඳහන් කොට ඇත. (148 පි.)

එස්. පරණවිතාන හා සී. ඊ. ගොඩකුඹුර විසින් 1963 දී සංස්කරණය කරන ලද Epigraphia Zeylanica, Vol-V, Part - II ග්‍රන්ථයෙහි, කිරින්ද ටැම්ලිපිය පිළිබඳ විමර්ශනයේ දී එළු ප්‍රාකෘතයට සම්බන්ධ කාව්‍යමය භාෂාවකින් එකී සෙල්ලිපිය ලියා ඇති බව ප්‍රකාශ කර ඇත. එසේ ම අනුප්‍රාසය හා එළිසමය සහිත ව වෘත්තගන්ධී ශෛලියෙන් රචිත බවත් විටෙක මාත්‍රා නියමයන්ට අනුකූල ව රචනය සම්පාදනය කොට ඇති බවත් පෙන්වා දී ඇත. (274 පි.)

මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියන් විසින් 1957 දී රචිත ශිලාලේඛන සංග්‍රහය - 4 කොටසෙහි කාව්‍යමය භාෂාව ද උපයෝගී කොට ගෙන ලියැවුණු තෝපා වැවේ වාන් ඇළ ලිපිය පිළිබඳ තොරතුරු දැක්වෙයි. (80 පි.)

විමලකිත්ති හිමියන් විසින් ම 1959 දී රචනා කරන ලද ශිලාලේඛන සංග්‍රහය - 5 කොටසෙහි කාව්‍යමය භාෂාවට බර ව ලියැවුණු සගම පර්වත ලිපිය (200 පි.) හා දේව ප්‍රතිරාජ පුවරු ලිපිය (287 පි.) පිළිබඳ තොරතුරු ඇතුළත් ව තිබේ.

සිංහල ශිලාලේඛන අතර පද්‍ය ආකෘතියෙන් ලියැවී ඇති සෙල්ලිපි පිළිබඳ දීර්ඝ විස්තරයක් කොත්මලේ අමරවංශ හිමියන් විසින් 1969 දී ලියන ලද 'ලක්දිව සෙල්ලිපි' කෘතියේ අන්තර්ගත ව ඇත. (58-61 පිටු). එහි මාත්‍රා යෝජනය, එකී ලිපි සම්පාදනයේ දී භාවිත විරිත් වර්ග ආදිය ගැන බොහෝ තොරතුරු අන්තර්ගත ය.

## 6. පර්යේෂණ ක්‍රමවේදය

පුරාවිද්‍යාව පිළිබඳ ප්‍රාමාණික උගතුන් විසින් සම්පාදිත ශිලාලේඛන සංග්‍රහ ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් තදනුබද්ධ ග්‍රන්ථ හා පර්යේෂණ ලිපි යනාදිය ද්වෛතීයික මූලාශ්‍රය ලෙසත් ගෙන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මේ පර්යේෂණ ලිපිය රචනා කර ඇත.

## 7. උපන්‍යාසය

සිංහල ශිලාලේඛන අතර කාව්‍යාත්මක භාෂාවකින් ලියැවුණු සෙල්ලිපි ඇත යන උපකල්පනය මත පදනම් ව සිට මෙකී පර්යේෂණය සිදු කර ඇත.

## 8. සාකච්ඡාව හා ප්‍රතිඵල

මුල් අවධියේ සෙල්ලිපියක දක්නා ලැබෙනුයේ, ඉතා ම සරල බස් වහරක් යොදා ගනිමින් තමාට කීමට අවශ්‍ය වූ වැදගත් ම පණිවුඩය ගද්‍ය භාෂාවෙන් එහි සටහන් කොට තැබීම යි. එහි දී අත්‍යවශ්‍ය තොරතුරට විනා භාෂාත්මක ශක්‍යතා පෙන්වීමට හෝ පුද්ගල වර්ණනාවන් හුවා දැක්වීමට හෝ ඉඩක් නො වී ය. වර්ණනා බහුල ව ඉදිරිපත් කිරීම බොහෝ විට සිදු වනුයේ ගද්‍යයේ දී නො ව පද්‍යයේ දී ය. ක්‍රි. ව. 1-2 සියවස්වල දී ආරම්භ වී මධ්‍ය සිංහල අවධියේ 12-13 සියවස් තෙක් වූ ඉතිහාසයකට හිමිකම් කියන පද්‍යමය ශිලාලේඛන කිහිපයක් දක්නට ලැබේ. එහි පද්‍ය ආකෘතිය ද ගැබ් ව තිබෙනු දැක ගත හැකි වුවත් ගීතවත් හා කාව්‍යමය අංශයන්ගේ පරිපූර්ණ භාෂා රටාවක් දැක ගත නො හැකි ය.

කොස්සවගම කන්ද ලිපිය

"මහරඣහ ගමණි - අබයහ දෙවන පියශ

රමණි බරිය මිලකතිස - විහරෙ කරිතෙ කතිය" (අමරවංශ හිමි, 1969:59)

(දේවානම්ප්‍රිය වූ ගාමිණී අභය මහරජුගේ රමණීය භාර්යාව වූ කති (කිත්තා බිසව) විසින් 'මිලක්ඛතිස්ස' විහාරය කරවන ලදි.)

මෙහි 'මහරඣහ' යන පදයෙහි මහාප්‍රාණ 'ඣ' යන්නක් ඇත. එහෙත් සාමාන්‍යයෙන් ගත් කල සිංහල පද්‍යවල කිසිදු විටෙක මහාප්‍රාණාක්ෂර අන්තර්ගත නො වී ය.

**කුසලාන් කන්ද ගී ලිපිය**

මෙහි පිහිටා ඇති පද්‍යමය ශිලාලේඛනය ද අපගේ අවධානයට ලක් විය යුතු ය.

උපරජ නග පුතෙ - රජ අබයෙ නම තශ පුතෙ

ගමිණි තිසෙ නම ලෙණෙ - කරිතෙ ශුදශන ශගශ (අමරවංශ හිමි, 1969:58)

නාග උපරජුගේ පුත්‍රයා 'අභය' නම් රජ ය. ඔහුගේ පුත්‍රයා 'ගමිණි තිශ' නමි. (ඔහු විසින්) ශුදශන (සුදර්ශන) නම් ලෙණ සංඝයා සඳහා කරවන ලදි.

**කොරතොට ගී ලිපිය**

පරුමක ශුමන පිත - පරුමක ශුමනහ ලෙනෙ

අගත අනගත චතුදිශ - ශගශ දිනෙ මහපදශන නම් (අමරවංශ හිමි, 1969:60)

ප්‍රමුඛ සුමනගේ පුත්‍රයා, ප්‍රමුඛ සුමනගේ මහාපදසන නමැති ලෙන පැමිණි නොපැමිණි සිවු දිග සංඝයාට දෙන ලදි.

මේ පද්‍යය වෙත අවධානය යොමු කිරීමේ දී තාලුජාක්ෂර හා දන්තජාක්ෂර බහුල ස්වරූපයක් නිරීක්ෂණය කළ හැකි ය.

මුල්ගිරිගල ගී සෙල්ලිපිය

මුහුන්දු ගිරිය කහවැල් - කියන රාල් මහල්ලන්

විසින් දියෙහී මස්සට - කෙටවූ සතර පියගටි (අමරවංශ හිමි, 1969:61)

කහවැල්ගම අධිපති මහල්ලන් විසින් මුහුන්දුගිරි (මූගිරි) ගල විහාරයෙහි මෙම පොකුණෙහි අටමස්සක වියදමින් පියගැට (ගල් පඩි) සතරක් කොටවන ලදි.

ඉහත දැක්වූ පද්‍යමය ශිලාලේඛනවලින් ගී ආකෘතියක් දැක ගත හැකි නමුත් කාව්‍යමය ස්වරූපයක් හෝ කාව්‍යයක අන්තර්ගත විය යුතු සේ සැලකෙන අලංකාර, අනුප්‍රාසාදි සුවිශේෂ ලක්ෂණ හෝ දැක ගත නො හැකි ය. මේවා පද්‍ය යැයි කිව හැකි එක ම ලක්ෂණය වනුයේ වෘත්තකට අනු ව රචනා වී තිබීම පමණි.

පූර්ව කාලීන සෙල්ලිපිවල දක්නට ලැබෙන 'අගත අනගත චතුදිශ ශගශ දිනෙ' යන පාඨය දෙස බලන විට එහි තාලුජාක්ෂර හා දන්තජාක්ෂර බහුලත්වයෙන් යුක්ත වූ යම් අකාරයක අනුප්‍රාසාත්මක ලක්ෂණයක් ගැබ් ව තිබෙන බවක් පෙනෙන මුත් කාව්‍යාත්මක භාෂා ප්‍රයෝගයකට ඉඩක් සලසා ගත් බවක් නො පෙනේ. සැබවින් ම එය 'ආගතානාගතස්ස චාතුද්දිසස්ස සංඝස්ස දේම' යන පාලි වාක්‍යයෙහි සිංහල භාවිතය සේ ගත හැකි ය.

කාව්‍යාත්මක භාෂා රටාවකින් නිර්මිත සෙල්ලිපි ගැන අවධානය යොමු කිරීමේ දී අපගේ අනිවාර්ය අවධානයට ලක් විය යුතු ලිපි කිහිපයක් දක්නට ලැබේ. ඒවා අතර පහත සඳහන් ලිපි සුවිශේෂ ය.

1. IV මිහිඳුගේ ජේතවනාරාම ලිපිය (අංක - 1) (Wickremasinghe, 1912:213-29)
2. I විජයබාහුගේ අඹගමුව පර්වත ලිපිය (Wickremasinghe, 1928:202-218)

3. මිණිපේ පුවරු ලිපිය (Paranavitana, 1955:146-61)

4. ඇපා මිහිඳුගේ කිරින්ද ටැම් ලිපිය (Paranavitana & Godakumbura, 1963:270-80)

5. තෝපා වැවේ වාන් ඇළ ලිපිය (විමලකිත්ති හිමි, 1957:80)

6. දේව ප්‍රතිරාජ පුවරු ලිපිය (විමලකිත්ති හිමි, 1959:286-94)

7. V මිහිඳුගේ පොලොන්නරු ටැම් ලිපිය (Codrington & Paranavitana 1934:59-67)

8. සගම පර්වත ලිපිය (විමලකිත්ති හිමි, 1959:199-207)

9. කොණ්ඩවට්ටවන් ටැම් ලිපිය (Paranavitana, 1955:124-141)

මධ්‍ය සිංහල අවධියේ දී ලියැවුණු IV මිහිඳු රජුගේ ජේතවනාරාම පුවරු ලිපිය කාව්‍යාත්මක ගද්‍ය ප්‍රබන්ධයක් සේ හඳුනා ගත හැකි ය. පරණවිතාන සූරීන් මේ සෙල්ලිපියෙහි භාෂා භාවිතය ගැන ප්‍රකාශ කරනුයේ උපමා හා රූපකාදිය උරෙනුර ගැටෙමින්, එකිනෙකා හා පොර බදමින් ඉන්ද්‍රීය මිථ්‍යා සංකල්පයන් භාවිතයෙහි පැවැති දක්ෂතාවන් මැනවින් යොදා ගනිමින් ප්‍රබන්ධිත සාලංකාර ගද්‍ය ආඛ්‍යානයක් බව යි (Wickremasinghe, 1912:213). එහි එතරම් ම විචිත්‍ර ශෛලියෙන් යුතු වාග්ව්‍යවහාරයක් අන්තර්ගත කොට ඇත. අභයගිරිය සහ අවටින් පිහිටි විහාර කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීම ගැන මෙහි කරුණු අන්තර්ගත කරනුයේ වාර්තාකථනයට ඉඩ නො තබමිනි.

"තෙදින්හිර් උදා ඉහිමැ ලක් අම්බුරෙන් දෙමෙළ් රුපු අඳුර් හැරැ ලො එක්හෙළි කැරැ සොමියෙන් නිසයුර්වැ ගැම්බුරෙන් සයුර්වැ තහවුර්නෙන් මෙර්වැ දෙනෙන් දිනිසුර්වැ ගුණට් (අවු)ර්වැ දසරද්දහමට් නෙවෙස්වැ තුනුරුවන් රුවනට් මැනෙඩාස්වැ මුනි සස්නට් එක්වහල් ටැම්බවැ" (Wickremasinghe, 1912:218).

(තේජසින් සූර්යයෝදයක් වූ එහෙයින් මැ ලංකා නමැති අහසින් අන්ධකාරය දුරු කර, ලෝකය ඒකාලෝක කොට සෞම්‍ය ගුණයෙන් චන්ද්‍රයා වැ ගැඹුරු ගුණයෙන් සාගරය වැ ස්ථිර ගුණයෙන් මහමෙර වැ දානයෙන් කුවේර වැ දසරාජ ධර්මයට ගෘහයක් වැ රත්නත්‍රය නමැති මාණික්‍යයට මඤ්ජුසාවක් වැ බුදුසස්නට අසහාය උපකාරයක් වූ ස්තම්භයක් වැ....)

මෙහි රජතුමා වර්ණනාවට ලක් කරන්නේ රූපක සමූහයක් යොදා ගනිමිනි. ලංකාව ගගන තලයකි. දෙමළ සතුරු සමූහයා එහි ඇති අන්ධකාරය යි. රජතුමා ඒ සතුරන් දුරු කොට ලෝකය ඒකාලෝක කළ සෞම්‍ය චන්ද්‍රයා යි; ගම්භීරතාවෙන් මහාසාග රය යි; ස්ථිරභාවයෙන් මහාමේරු පර්වතය යි; ධනවත්භාවයෙන් හෝ දානපතිත්වයෙන් කුවේරයා යි; දශරාජ ධර්මයට නිවාසය යි; ත්‍රිවිධරත්න නමැති මාණික්‍යයන්ට මඤ්ජුසාව යි; බුද්ධ ශාසනයට මහෝපකාරී වූ ස්තම්භය යි.

මෙවැනි අදහස් තත්කාලීන ගද්‍ය ග්‍රන්ථයන්ගෙන් වුවත් සොයා ගැනීම එතරම් ම අපහසු නො වේ. එම නිසා යුගයේ ගද්‍ය සම්ප්‍රදායයට බලපෑ වර්ණනාත්මක රීතිය ශිලාලිපිකරණයට ද යොදා ගෙන ඇති බව පෙනේ.

අභයගිරි විහාරය සහ එහි වැඩ වසන භික්ෂූන් වහන්සේ ගැන කරනු ලබන වර්ණනය ළගන්නා සුලු එකකි.

"අබයතුරා මහසෑ හිමගල් සොබොන මහගත් උරක් පෙලට් නුවණ් පියා (විහි)දා වියත් ගුරිළ් මුළ් බමන දහම්දරන් දහම් වියක්හන ගුමන් ගුගුමන සත්දනන් රුවන් ආරෙන් වොරොදන අපිස් සතොස් සලෙ සැහැ මහණගණ පබ්ළ ලිය ඉළ් රන්දන විහිගුම් පඬෙර පවුර් තරග් වදම්බන මුනින්ද් පුද උදම්මන" (Wickremasinghe, 1912:218).

(අභයගිරි මහාචෛත්‍යය නමැති හිමාලය පර්වතයෙන් ශෝභමාන වූ ග්‍රන්ථ නමැති නාග පන්තියට ඥාන නමැති පියාපත් විදහාගෙන පණ්ඩිතයන් නමැති ගුරුළු සමූහයා හැසිරෙන ධර්මධරයන්ගේ ව්‍යාඛ්‍යාන නමැති ඝෝෂායෙන් ගිගුම් ගත් සජ්ජන නමැති සමුද්‍රයෙන් බබලන අප්පිච්ඡතා සන්තුට්ඨිතා සරල බව යන

ගුණයන්ගෙන් යුත් ශාක්‍ය පුත්‍ර භික්ෂු සමූහ නමැති ප්‍රවාල ලතා වනයෙන් රඳනා වූ උස් සුදු පවුරු නමැති රළ බබලන බුද්ධ පූජාවෙන් උද්දාම වන්නා වූ...)

මෙය රූපකයන්ගෙන් පරිපූර්ණ වර්ණනාවලියක් සේ විස්තර කිරීම අතිශයෝක්තියක් නො වේ. තත්කාලීන ගද්‍ය සාහිත්‍යයෙන් පවා මෙතරම් රසවත් ව රූපක යොදන ලද ගද්‍ය ඛණ්ඩයක් සොයා ගැනීම එතරම් ම පහසු නො වේ.

සුධවල වූ අභයගිරි මහාචෛත්‍යරාජයා හිමාලය පර්වතය වැනි ය. එම විහාරයෙහි නාගදරණ මෙන් ගොඩ ගසන ලද පුස්කොළ පොත් සමූහයකි. නාග සමූහයා වෙත නෙත් හෙළන ගුරුළු රාජයෝ නම් මහා පණ්ඩිත ජනයෝ ය. ඥාන නමැති පියාපත් විදහ විදහා නෙතු අයා නිරතුරු ව පත-පොත පරිහරණය කිරීම මෙයින් වර්ණිත ය. එසේ ම බොහෝ සත්පුරුෂයෝ බණ ඇසීමට මේ වෙහෙරට එති. එසේ එනුයේ සුළු පිරිසක් නො වේ. ජන සයුරකි. ධර්ම කථිකයන්ගේ ව්‍යාඛ්‍යානයන්ගෙන් ද පද විවරණයන්ගෙන් ද එම ජන සයුර ගිගුම් ගනියි. අපිස්, සතොස්, චාම් බවින් පිරි සඟ ගණ රත් පබළු වනයන් මෙන් නිතර ම වෙහෙරෙහි බබලනු පෙනේ. එසේ රත් පබළු වනයක් මෙන් පෙනෙනුයේ ඇයි? සඟ ගණ රත් පැහැ සිවුරු පොරවා වැඩ වසන හෙයිනි.

මෙහි පැනෙන උපමා-රූපක ඉතා මැනවින් ගළපා ඇති බැවින් රස ජනනයෙහි ලා ප්‍රබල ශක්‍යතාවක් නිර්මාණය වී ඇත. මෙවන් වර්ණනා කෙසේ වත් සෙල්ලිපියකින් බලාපොරොත්තු විය නොහැකි තරම් ය. සුළු ඉඩෙක අවශ්‍ය වාර්තාවට තැන දිය යුතු බැවිනි. එහෙත් සමකාලීන සෙල්ලිපිකරුවා රසඥතාවෙන් පරිපූර්ණයකු විය යුතු බැව් මින් අපට හැඟී යයි.

I වන විජයබාහුගේ අඹගමුව පර්වත ලිපියෙන් සමනොළ ගලට කරනු ලබන පූජාවන් ගැන සඳහන් වේ. එහි දී පුද්ගල වර්ණනාවකට සෙල්ලිපියේ මුල් කොටසේ දී ම අවස්ථාවක් උදා කර ගනී.

"තුමා ස(ර)ණ නියරසින් නන් රජ මුඳුනැ බිසෙස්වූ ස(ා)හතෙදින් හිරු පැළකෙමින් මෙහෙසුරු දළදපින් උවිඳු රජවිරිතින්

සුරිඳු (පබඳ) දෙනෙන් දිනිසුරන් සත්(සෙතින් කිති)සුරු පැනස(රි)න් සුරගුරු සොම්ගුණෙන් නි[ස]යුරු" (Wickremasinghe, 1928:211).

(තමාගේ පා නියවල රශ්මියෙන් නොයෙක් රජ්ජුරුවන්ගේ මුදුන් අභිෂේක වූවා වූ, දැඩි තේජසින් සූර්යයා ද, ප්‍රකට කෝපයෙන් මහේශ්වරයා ද, දැඩි මානයෙන් විෂ්ණු ද, රාජ විලාසයෙන් ශක්‍රයා ද, නිරතුරු දෙන දානයෙන් කුවේරයා ද, සත්ත්ව ශාන්තියෙන් කඳ සුරිඳු ද, ප්‍රඥාවෙන් සුරගුරු (බ්‍රහස්පති) ද සෞම්‍ය ගුණයෙන් චන්ද්‍රයා ද (පෙන්වමින්))

බොහෝ රජවරුන් මේ රජුගේ පාදාභිවන්දනය කළ බව කියනුයේ ඒ රාජෝත්තමයාගේ පාදයේ නිය රශ්මිය වැදී ඒ ඒ රජවරුන්ගේ ශීර්ෂාභිෂේකය වූ බව කීමෙනි. එසේ ම දැඩි වූ තේජස කරණ කොට ගෙන එතුමා සැබෑ ම සූර්යයා ය; අසාධාරණයේ දී ප්‍රකට ව පෙනෙන කෝපය කරණ කොට ගෙන එතුමා සැබෑ ම ඊශ්වරයා ය; අධික වූ මාන්නය කරණ කොට ගෙන එතුමා සැබෑ ම විෂ්ණු ය; රාජ ශෝභාව කරණ කොට ගෙන එතුමා සැබෑ ම ශක්‍රයා ය; නිරන්තරයෙන් දෙනු ලබන්නා වූ දානය කරණ කොට ගෙන එතුමා සැබෑ ම කුවේරයා ය; ලෝක සත්ත්වයා වෙත සිදු කරන්නා වූ ශාන්තිය කරණ කොට ගෙන එතුමා සැබෑ ම ස්කන්ධ දිව්‍ය රාජයා ය; කුශාග්‍ර බුද්ධිය කරණ කොට ගෙන එතුමා සැබෑ ම සුරගුරු ය; සෞම්‍ය ගුණය කරණ කොට ගෙන එතුමා සැබෑ ම චන්ද්‍රයා ය. මෙසේ රූපක සමූහයක් භාවිතයෙන් කෙරෙන උක්ත වර්ණනය ප්‍රතිභාපූර්ණ කවියකුගේ ම නිර්මාණයකි.

මෙහි යෙදී තිබෙන වස්තූන් අපට නිරන්තරයෙන් ම සාහිත්‍ය ග්‍රන්ථවල දී හමු වේ. පූජාවලිය, බුත්සරණ වැනි ග්‍රන්ථයන්හි වෙසෙසින් පෙනෙන මෙම රටාව සෙල්ලිපියට ද අන්තර්ගත වීමෙන් පෙනෙනුයේ කාව්‍යාත්මක බස් වහරකට සිංහලයා දක්වූ අභිරුචිය යි.

මේ පාඨයෙහි බෙහෙවින් පෙනෙන 'ස, ර, න' ආදි අක්ෂරයන් ළං ළං ව යොදා තිබීමෙන් කිසියම් ලලිතවත් භාවයක් මෙන් ම ශ්‍රැතිරම්‍යතාවක් ජනිත කිරීමට වෙර දරා ඇති අයුරක් පෙනී යයි.

මේ ලිපියෙහි ම පෙනෙන තවත් කාව්‍යාත්මක පාඨයක් මෙසේ ගෙන හැර දැක්විය හැකි ය.

"තුමා තු(නු) කප්තරුමින් නොමින් නන් රුවින් දුන් (ව)තුරෙන් නන් දෙසින් ප(තළෙ) මුළු දිළින්දු (සි)ත් සයුරැ පුරමින් මුළු ලෙව්හු පතළෙ" (Wickremasinghe, 1928:211).

(තමාගේ ශරීර නමැති කල්ප වෘක්ෂයෙන් ප්‍රමාණ කරන ලද, අප්‍රමාණ ධන නමැති ප්‍රවාහයෙන් නොයෙක් දිශාවල පැතිරුණා වූ, නොයෙකුත් දිළින්දන්ගේ සිත නමැති සාගරය පුරවමින් මුළු ලෝකයෙහි පැතිරුණා වූ)

මෙහි දී තමාගේ ශරීරය සිතූ පැතූ සම්පත් දෙන කල්ප වෘක්ෂය කොටත් දෙනු ලබන ධනධාන්‍යාදිය ප්‍රවාහයක් කොටත්, ඒවා ලබා ගන්නා දිළින්දන්ගේ සිත් ජල පහරින් පිරෙන මහසයුර කොටත් වර්ණනා කර ඇත.

උක්ත පාඨයෙහි වාක් සංයෝජනය විමර්ශනය කරන විට පෙනී යනුයේ 'ත කාර, න කාර, ර කාර' බහුල, අනුප්‍රාස රසයෙන් අනූන වාක්‍ය රටාවක් යොදා ගෙන ඇති බව යි. එය "තුනු කප්තරුමින් නොමින් නන් රුවින් දුන් වතුරෙන් නන් දෙසෙන්, යන මේ පාඨයෙන් මැනවින් ම ප්‍රකට වෙයි. මෙහි දක්නට ලැබෙනුයේ වෘත්තගන්ධී ශෛලියේ භාෂාත්මක ව්‍යවහාරයකි.

මිණිපේ ඇළ නිර්මාණය කිරීම ගැන සහ භාම නමැති සෙන්පතියා දෙමළ සතුරන් මර්දනය කළ ආකාරය ගැන කරුණු සඳහන් මිණිපේ පුවරු ලිපිය කාව්‍යාත්මක බස් වහරක් උපයෝගී කර ගනිමින් රචිත බැව් විශද වෙයි.

"සිරිකතට උවිඳු වන් විසිකතට බඹහු වන් පළතෙදට හිරුහු වන්, සොම්ලෙසට සිසිහු වන් මලෙවිකුලතිලකායමාන මහපින්සර භාම සෙනාධිරාජයො" (Paranavitana, 1955:157).

(ශ්‍රී කාන්තාවට විෂ්ණු වැනි වූ සරස්වතියට බ්‍රහ්මයා වැනි වූ ප්‍රකට තේජසට සූර්යයා වැනි වූ සෞම්‍ය ස්වභාවයට චන්ද්‍රයා වැනි වූ අනංග කුලයට තිලකයක් බඳු වූ මහපිනින් සාර වූ භාම නැමති සේනාධිපතියා)

මෙහි පුද්ගල වර්ණනාවක් දක්වා ඇත. එහි දී උපමා භාවිතය සිදු කරනුයේ ලෝකයේ තිබෙන ඉහළ ම වස්තුවලට මොහුගේ තිබෙන ගුණයන් ආරූඪ කරමිනි. එහි මුලින් සඳහන් පද කොටස් හතර ම එක සමාන මාත්‍රා ගණනකින් සකස් වී ඇති බවක් පෙනී යයි. එය කවියක ආකාරය ගන්නා බවක් ද පෙනේ.

සිරිකතට උවිඳු වන්

විසිතකට බඹහු වන්

පළතෙදට හිරුහු වන්

සොමිලෙසට සිසිහු වන්

මෙහි කිහිප පළෙක එළිවැට තැබීමට ද අමතක කර නැති බවක් පෙනී යයි. මේ භාම සේනාධිපතියා සතුරන් නැසූ අයුරු විචිත්‍ර වාක් ශෛලියකින් දක්වා ඇත්තේ මෙසේ ය.

“හසිසංඝට්ටණයෙන්

ජනිතවූ ගිනිපුපුරුනිකරයෙන්

නිරතවූ නොයෙක් සියගණන්

යුද්ධයෙහි ජය ලදින්

රුපුනැඟින් උෟර ගත් රුධිරයෙන්

තම්බුරවනගහන සෙ මීමඬුලු සරහමින්....”

(Paranavitana, 1955:157).

(අසිපත් ගැටීමෙන් හටගත් ගිනි පුපුරු නමැති රශ්මියෙන් නිරන්තර වූ, නොයෙක් සිය ගණන් යුද්ධවල දී ජය ලැබීමෙන් සතුරන්ගේ ශරීරයෙන් උරා ගත් ලෙයින් රත් නෙලුම් වනයක් සේ මිහිමඬල සරසමින්)

මෙහි සඳහන්,

“ගිනිපුපුරු නිකරයෙන් නිරත වූ... රුපුනැඟින් උෟර ගත් රුධිරයෙන් තම්බුරුවනගහන සේ....”

යන පාඨයෙන් අනුප්‍රාසාත්මක බස් වහරක් යෙදී තිබෙන බවත් ‘ර’ කාරය බහුල ව යෙදීමෙන් යුද්ධයේ දෝංකාරය නංවන්නාක් වැනි ස්වභාවයක් ජනිත වන බවත් පෙනේ.

මිණිපේ ඇළ වර්ණනා කිරීමට යොදා ගන්නා උපමාව ඉතා චමත්කාර ජනක ය. ‘මහවැලිගං නැමැති බිසවුන් ලොවැඩ පිණිස වැඩූ පුත්රුවනක් බඳු ලක්දිවට මුල්කොටසර වැ තුබූ මිණිබෙ ඇළ....” (Paranavitana, 1955:158).

(මහවැලි ගඟ නමැති බිසව ලෝවැඩ පිණිස වැදූ පුතකු බඳු වූ ලංකාවට කොටසර නම් ප්‍රධාන වැව මෙන් තිබුණු මිණිපේ ඇළ) මෙහි දී මහවැලි ගඟ මවක ලෙසත් ඉන් පෝෂණය වන මිණිපේ ඇළ පුතකු ලෙසත් වර්ණනා කර තිබීම සැබවින් ම කාව්‍යෝක්තියට සෙල්ලිපි රචකයා දැක්වූ රුචිකත්වය පෙන්නුම් කරයි.

කාවන්තිස්ස රජතුමා විසින් කරවන ලද තිස්සමහාරාම විහාරයට, ඉන් පසු කලෙක වාසය කළ ඇපා මිහිඳු නම් තැනැත්තා විසින් කරන ලද පූජාවක් ගැන කිරින්ද ටැම් ලිපියෙන් ප්‍රකට වේ. එම ලිපියේ කාව්‍යාත්මක වාක් ශෛලියකින් ලිඛිත කොටසක් අපට හමු වේ. ලංකා මාතාව පිළිබඳ අසිරිමත් වර්ණනාවක් එහි අන්තර්ගත ය.

“තරඟවැළැ රැළි ඔත් මහමුහුන්ද් මෙ නිල්දියුල්

හන් නුබගඟ් මෙ දළ ලෙළ මුත්හරිත් හොබනා

හත් උදාගිරිමෙ මිණි කොඩුල් පලන් දම්බදිව්

පොළො අගමෙහෙස්න පලන් මිණි සුම්බුළුවක් බන්දු

නන් සිරිලකළ සිරිලක් දිව්හි හිරුගොත්කුලෙන්....”
(Paranavitana & Godakumbura, 1963:276).

(රැල මාලා නැමති රැළි බහාලූ, මහාසමුද්‍ර නමැති නිල් දුහුලක් හැන්දා වූ, ආකාශ ගංගා නමැති ලොකු බබලන මුතුහරින් ශෝභමාන වූ අස්ත පර්වතය හා උදය පර්වතය යන මොවුන්ගේ මස්තක නමැති කර්ණාභරණ පැලැඳි ජම්බුද්වීපය නැමති අගමෙහෙසිය විසින් පලඳනා ලද මැණික් චුම්බටයක් බඳු නොයෙක් සම්පත්තියෙන් අලංකාර වූ ශ්‍රී ලංකාද්වීපයෙහි)

මෙහි යෙදී තිබෙන අතිශයෝක්තියෙන් තොර කාව්‍යාත්මක ප්‍රකාශන දෙකක් ගැන කරුණු විමසීම වටනේ ය.

ලංකාව වට වී ඇත්තේ මහාසමුද්‍රයෙනි. එහි ජලය නිල් පැහැයෙන් බබලයි. නිරන්තරයෙන් ම මහජලකඳ නල බලයෙන් සසල වෙ යි. මේ සියල්ල එකට එක්වූ කල පෙනෙනුයේ ලංකා මාතාව රැල නැගෙන මහ සමුදුර නමැති නිල් රෙදි පට ඇඳගෙන සිටින්නා සේ ය.

එසේ ම අනෙක් පාඨයෙන් මතුවන්නේ මෙවැනි අදහසකි. ලංකාව, ඉන්දියාව ආසන්නයේ පිහිටි රත්නද්වීපයකි. දඹදිව නමැති අගමෙහෙසිය ලංකාව නමැති මැණික් ඔබ්බවා කරන ලද දරන්න හිසෙහි පැලඳ ගෙන ඇත. මින් ලංකාව ඉන්දියාව ආසන්නයේ ම පිහිටි බවත්, හිස් මුදුනෙහි පලඳින ආභරණයක් තරමට ම වටින, ස්වාභාවික සම්පතින් ද සෞන්දර්යයෙන් ද පිරී ඇති බවත් ගම්‍ය වේ.

තෝපා වැවේ වාන් ඇළ ලිපිය කාව්‍යාත්මක ශිලාලේඛන කලාවෙහි තවත් විශේෂ ලක්ෂණයක් අන්තර්ගත වූවක් සේ හඳුනා ගත හැකි ය. එනම් එහි සිවුපද කවියක් රචනා කර තිබීම යි. කවිවලින් හා ගීවලින් යුක්ත සෙල්ලිපි ඇතත් ඒවායෙහි එතරම් කාව්‍යාත්මක යෙදුම් දක්නට නො ලැබේ. නමුත් මෙහි කාව්‍යාත්මක ගුණය ද රැක ගැනීමට වෙසෙසින් ම වෙර දරා තිබේ. එම නිසා කාව්‍යමය බස් වහර මෙන් ම සඳැස් ආකෘතිය ද කැටි කර ගත් ශෛලමය ලේඛනයක් සේ මෙය අගය කළ හැකි ය.

"මිණිමුතු නිල්මරා පුස්රා ගොමෙද වෙරළු විදුරා

පබළු නන් අම්බරණ සළු සුවඳ මල් බුලත් කපුරා

මෙයින් යෙදී හුනද අඟර නොලද හෙ නො මනහරා

බතුපයා කලිඟු නිරිඳු නුවනින් විඳු ඉසුරා"

(විමලකිත්ති හිමි, 1957:80).

(මැණික්, මුතු, නීලවර්ණ මරකත, පුෂ්පරාග, ගෝමේද වෛදූර්ය, දියමන්ති, ප්‍රවාල (පබළු) නානා අබරණ, වස්ත්‍ර, සුවඳමල්, බුලත්, කපුරු (යන) මේවායින් යෙදී සිටියත් අංගරාග නොලද්දේ නම් හේ (ඒ තැනැත්තා) මනෝඥ නොවේ. (එහෙයින්) කාලිංග නරේන්ද්‍ර තෙමේ ඥානයෙන් ආහාර උපදවා ඓශ්වර්යය වින්දේ ය.) (විමලකිත්ති හිමි, 1957:83).

මින් ගම්‍ය වන්නේ මුතුමැණික් ආදි සූසැට අබරණින් හා සුවඳ වර්ගයන්ගෙන් සැරසුණේ නමුදු අංගරාගාලේපයෙන් තොර වූයේ නම් පුද්ගලයකු අලංකෘත නොවන බව යි. එමෙන් ම රජතුමා කොතරම් ඥානාන්විත වූයේ නමුත් රටක ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමට සමත් නොවූයේ නම් ඔහු ද වටිනා තැනැත්තකු නොවන බව යි.

දේව ප්‍රතිරාජ පුවරු ලිපියෙහි ද කාව්‍යාත්මක බස් වහර යොදා ගත් සෙල්ලිපි පාඨයක් දක ගත හැකි ය. එහි දී යම් ආකාරයක සුගායනීය ආකෘතියක් දක්නට ලැබේ. කිසියම් වෘත්තයක සුගන්ධයක් විහිදුවන අයුරින් රචිත බවක් ද එය කියවන විට හැඟී යයි.

"තමා (සර)ණ නියරැස් තොයින් නෙ(නර) නා ම(ත) තෙ(මා)

(ර)න්රුවන් ග(ල)න ලෙස දන් වතුරු පතුරුවා

නන්දෙසින දිළින්දුමුළු එකාවන් (සිත්පුරා)"

(විමලකිත්ති හිමි, 1959:287).

(තමාගේ පාදයන්හි වූ නියරැස් නැමැති ජලයෙන් නොයෙක් මිනිසුන්ගේ සහ නාගයන්ගේ මස්තකයන් තෙමා, රත්රන් සහ මැණික්

ගලන පරිද්දෙන් දාන ප්‍රවාහය පතුරුවා, නොයෙක් දිශාවලින් පැමිණි දිළිඳු ජන සමූහයාගේ සිත් නිරන්තරයෙන් සම්පූර්ණ කොට)

මේ පාඨයෙහි අවසාන පදය 'ආ' යන ස්වරය යොදමින් නිම කර ඇත. එසේ ම කවියක එළිසමය යන්න ව්‍යඤ්ජනයකින් ම තැබිය යුතු ය, ස්වරයකින් තැබීම එතරම් ප්‍රශස්ත නැත යනාදි සංකල්ප මෙකී සෙල්ලිපියෙහි නිර්මාපකයා එතරම් ගරු නොකළා විය හැකි ය.

එලෙස ම මෙම වැකි කෙරෙහි ද අවධානය යොමු කිරීම වටී.

"සරණ නියරැස් තොයින් නෙ නර නා"

"රන්රුවන් ගලන ලෙස දන් වතුරු පතුරුවා"

මෙහි දී 'ර' කාර 'න' කාර බහුල අනුප්‍රාස පූර්ණ වාක් ශෛලියක් උපයුක්ත බව මැනවින් පසක් වේ.

ඒ මිහිඳු රජුගේ පොලොන්නරු ටැම් ලිපියේ එන පුද්ගල වර්ණනය කවි බස උපයෝගී කොට ගෙන රචිත බැව් පෙනී යයි. එහි යෙදී තිබෙන උපමා-රූපක ආදිය කවියකුගේ ප්‍රතිභාව ප්‍රකට කෙරෙන තරම් ය.

"නාගදෙවුදෙවිබම්බුන් වුටුනුමැණමෙ බමර වැළැන් හෙබි සරණපීමෙන් ලකුළු ලො පිළිසරණ මුනිඳු නිපත් සැහැකුලකෙව්ලු සුදොනාපරපුරෙන් ආ ලක් නිරින්ද්කිරිළ්කුළ්හි තෙද්ගිනින් දැවි...."
(Codrington & Paranavitana, 1934:62).

(නාග, බුමාටුදේව, අකාශස්ථ දේව, බ්‍රහ්ම යන මොවුන්ගේ කිරීට මාණික්‍ය නමැති භ්‍රමර සමූහයෙන් හෙබි පා පියුමෙන් අලංකාර වූ, ලොවට පිහිට වූ බුදු රජාණන් වහන්සේ උපන්නා වූ ශාක්‍ය කුලයට කොඩියක් වැනි ශුද්ධෝදන රජුගේ පරපුරෙන් පැවත ආ ශ්‍රී ලංකා නරේන්ද්‍රයන්ගේ කිරීට කූටයන්හි වූ තේජස් නමැති ගින්නේ දවන ලද)

මෙහි යෙදී ඇති උපමා අතරින් කාව්‍යාත්මක බවින් පිරිපුන් එක් උපමාවක් කෙරෙහි අප අවධානය යොමු කිරීම වටී.

"වුටුනුමැණමෙ බමර වැළැන් හෙබි සරණපීමෙන් ලකුළු"

දෙවි බඹුන් පලඳින ඔටුනුවල නිල් මැණික් ආදිය ඇත. ඔවුන් බුදුන් පාමුල්හි වැඳ වැටෙනුයේ එකකු දෙදෙනකු බැගින් නොව සමූහ වශයෙනි. එවිට ඔටුනුවල ඇති නිල් මැණික් කැට පෙනෙනුයේ කළුවන් හෝ තදනිල්වන් බමර රැළක් මෙනි. නැමූ හිස් ඔසවන විට පෙනෙනුයේ බුදුන්ගේ පා පියුමෙහි රොන් ඉරීමට ගොස් එකවිට උඩට නැගෙන බමර කැලක් මෙනි.

කෙතරම් අපූරු, ප්‍රතිභාපූර්ණ, රූපකාකීර්ණ භාෂා යෝජනයක් ද? සාහිත්‍ය ග්‍රන්ථවල මෙවන් උපමා බෙහෙවින් දක්නට ලැබුණත් සෙල්ලිපියකින් මෙවැන්නක් සොයා ගැනීම අතිශය දුෂ්කර ය.

සගම පර්වත ලිපිය ද මේ ගණයට ම අයත් වන සෙල්ලිපියකි. එහි තත්සම පද බහුල, අනුප්‍රාසවත් පද අධික වර්ණනාත්මක රීතියක් භාවිත කර ඇත. පුද්ගල වර්ණනයක් වන එය ලෝකයේ පවතින සුවිශේෂ වස්තූන් ද සම්බන්ධ කරගෙන සංසන්දනාත්මක ව ඉදිරිපත් කර ඇත.

"ශ්‍රී භුවනෛක බාහු රාජොත්තමයහට නව(ව)නු සකල ගුණමණි නිධි ජලනිධි ප්‍රශස්ත ශක්තිධර ෂණ්මුඛ පරනාරී පරාංමුඛ ශ්‍රී බෝධි වඩා (සැපැමි)ණි ගණවැසි කුල මාතෘවශ පිතෘවශ මෙණුවර කුල මෙයුග යුගන්ධර (සු)රින්ධර දිවාකර නිශාකර ලෙසින් ලො එකලු කළ සිරිනුදුල අළකේශ්වර දේවමන්ත්‍රීශ්වර දෙබෑයන්" (විමලකිත්ති හිමි, 1959:200).

(ශ්‍රී බුවනෛකබාහු රාජෝත්තමයාගේ නව වැන්න වූ රාජ්‍ය වර්ෂයෙහි, සියලු ගුණ නැමැති මැණික්වලට නිධාන වූ සමුද්‍රය වැනි, පසස්නා ලද ශක්ති නම් ආයුධය දරන කතරගම දෙවියන් වැනි පරස්ත්‍රීන්ට පිටුපෑ, ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවා ගෙන ආ ගණවැසි කුලය මාතෘ වංශය කොටත් මේණවර කුලය පිතෘ වංශය කොටත් ඇති මේ ගණවැසි කුල මේණවර කුල යන දෙකුලය නැමැති යුගන්ධර සුරින්ධර යන දෙපර්වතයෙහි (උදා වූ) හිරුසඳු දෙදෙනා මෙන් ලෝකය ඒකාලෝක කළ, සැපතින් බබලන අලකේශ්වර දේවමන්ත්‍රීශ්වර යන දෙසොහොයුරන්)

මෙහි පෙනන

"ගුණ මණි නිධි ජලනිධි"

"ෂණ්මුඛ පරනාරී පරාංමුඛ"

"යුගන්‍ධර සුරින්‍ධර දිවාකර නිශාකර"

"ලො එකලු කළ සිරිනුදුල"

යන පාඨයන් අනුප්‍රාසවත් බස් වහරකට නැකම් කියයි. එසේ ම මෙහි උපුටා දැක්වූ පළමු, දෙවන හා තෙවන පාඨවල දී සංස්කෘත මිශ්‍ර පණ්ඩිත ප්‍රිය භාෂා රටාවක් භාවිත කිරීම නිසා ලිපියට ඕජෝ ගුණ මිශ්‍ර ප්‍රෞඪත්වයක් ආරෝපණය වී ඇත. තෙවන පාඨය නුමුසු හෙළයෙන් රචනා වී ඇති නිසා භාෂාවට සුලලිත බවක් ආරෝපණය වී ඇත.

කොණ්ඩවට්ටවන් ටැම් ලිපිය ද කාව්‍යමය භාෂාවට ප්‍රමුඛත්වය දෙමින් රචිත බව එහි පෙනෙන පාඨයන් නිරීක්ෂණය කර බලන විට පෙනී යයි. එහි ආරම්භයේ ම එනුයේ රාජ වර්ණනයකි.

"සිරිවත් සොම්මගුල් සිහසුන් රක්ගල්තල අරාය් වදන් බෙරසීනානෙන් රුපුවරණන් මඳ් සින්ද සීපැරැක්මෙන් වැදැම්බි අපිරියත් ලොඉකුත් ගුණමුළින් උතුරත් වැ මුළු දම්බදි(ව්හි) අන් කැත්කුල පියමිලි කළ...." (Paranavitana, 1955:135).

"(මිණිවුටු)නෙන් පැහැයු සියමුඳ්නෙ (බිසෙ)ස් දිය (මෙන් දසදෙ)සෙහි නුමුත්සිරි අ(නත් අ)පිරිසෙ (සොමි) නිමල (ගුණවතුරු පැති)රි ඔකාරද්කුලට් තලාටික් වූ" (Paranavitana, 1955:135).

(ශ්‍රීමත් වූ සෞම්‍ය වූ උතුම් සිංහාසන නමැති මනෝසිලා පර්වත තලයට නැගැ වචන නමැති භයානක සිංහ නාදයෙන් සතුරන් නමැති හස්තීන්ගේ මදය සිඳ දැමූ සිංහ පරාක්‍රමයෙන් වැජඹුණු අප්‍රමාණ ලෝකෝත්තර ගුණ සමූහයෙන් උතුරන්නෙක් වැ සමස්ත ජම්බුද්වීපයෙහි අන්‍ය රජ කුලයන් දාස කළ... මැණික් වොටුන්නෙන් අලංකාර කළ ස්වකීය මස්තකයෙහි අභිෂේක කළ ජලය මෙන් දශ

දිශායෙහි පැතිරුණු අප්‍රමාණ සම්පත්ති නමැති සෞම්‍ය නිර්මල ගුණ ප්‍රවාහය පැතිරී ඔක්කාක රජ කුලයට තිලකයක් වැනි වූ....)

මෙහි පැනෙන උපමා රූපක මැනවින් සංයෝජනය කළ වාක්‍යයක්, විශේෂ අවධානයට ලක් විය යුතු තරම් ය. රජුගේ සිංහාසනය මනෝසිලා පර්වතයකි. එය අරා සිටින නරේන්ද්‍රයා වදන් නමැති සිංහ නාදය පිට කරයි. සිංහ නාදයෙන් බියපත් වන්නේ සතුරන් නමැති මද තෙදින් උදම් වූ ගඳතුන් ය. මෙවන් උපමාලංකාරයෙන් සුපෝෂිත භාෂා භාවිතය සිංහල සාහිත්‍යයෙහි දුර්ලභ නැත ද සෙල්ලිපි අතර නම් සුදුර්ලභ ය.

VI වෙනි මහින්දගේ මැදිරිගිරිය පුවරු ලිපියෙහි ද කාව්‍යාත්මක බස් වහරකින් යුත් ගද්‍ය පාඨ කිහිපයක් දක්නට ලැබේ.

“යස සොමිනිමලසරාසිසිරැසින් රජකුල කිරිමුහුන්ද්....” (යසස නමැති සෞම්‍ය වූ නිර්මල වූ ශරත් චන්ද්‍ර රශ්මියෙන් රාජකුලය නමැති ක්ෂීර සාගරය....) (Uduwara, 1991:49).

මෙහි ‘ස’ කාර ‘ර’ කාර බහුලත්වය පදනම් කරගත් අනුප්‍රාසාත්මක බස වහරක් ද භාවිත බැව් නිරීක්ෂණය කළ හැකි ය.

“සැහැකුල කිරිමුහුන්ද් මත පුන්සන්දක් බඳු වැ රජසිරින් සුරින්දු පැනසරින් සුරගුරු පබඳ දෙනෙන් දිනිසුරු පරයා තමා යසතෙජ්හිර් සන්දනෙන් ලොව් පැහැයූ....” (Uduwara, 1991:49).

(ශාක්‍යකුලය නමැති ක්ෂීර සාගරය මත පූර්ණ චන්ද්‍රයා මෙන් රාජශ්‍රීයෙන් දේවේන්ද්‍රයා ද ප්‍රඥාසාරයෙන් සුරාචාර්යවරයා ද දෙන්නා වූ දානයෙන් කුවේරයා ද පරදවා තමාගේ යශස හා තේජස නමැති සූර්ය චන්ද්‍ර දෙදෙනාගෙන් ලෝකය ආලෝකවත් කළ....)

ශාක්‍යකුලය වනාහි කිරිමුහුද යි. මේ රජතුමා ඒ ක්ෂීර සාගරය මතට පැයූ චන්ද්‍රයා ය. එසේ ම රාජ්‍ය ශ්‍රීයෙන් ශක්‍රයා ය. ප්‍රඥාමහිමයෙන් දෙවියන්ගේ ආචාර්යවරයා වූ සුරගුරු ය. දන් දීමෙන් කුවේරයා ය. තමාගේ යශස හා කීර්තිය නමැති චන්ද්‍ර සූර්ය දෙදෙනා ලෝකය ආලෝකවත් කරන්නේ ය.

මෙහි රජතුමා වර්ණනා කිරීමේ දී රූපක සමූහයක් භාවිත කරමින් විචිත්‍රවත් වූ වර්ණනයක් සිදු කොට ඇති බව පෙනී යයි.

## 9. නිගමනය

උක්ත කරුණු කෙරෙහි විචාරාක්ෂිය යොමු කිරීමෙන් අපට පෙනී යනුයේ ක්‍රි. පූ. හා ක්‍රි. ව. මුල් අවධීන්හි දී ලාංකික සිංහලයා සාටෝප, සාලංකාරයෙන් තොර සරල, සුගම බස්වහරක් භාවිතයෙන් තමන් යම් පරිත්‍යාගාදි කාර්යයක් සිදු කළ විට ඒ පිළිබඳ ව තොරතුරු ගල්පුවරුවක සටහන් කොට තැබූ බව යි. එහි ලා සැබවින් ම අපේක්ෂිත වූයේ හුදු සන්නිවේදන කාර්යය පමණි. එහෙත් පශ්චාත් කාලීන සිංහල ජනයා තමන් සිදු කළා වූ කාර්යය පිළිබඳ සන්නිවේදනමය අරමුණ ඉටු කර ගන්නා අතර ම සාහිත්‍ය රස පූර්ණ, අතිශයෝක්තියෙන් අනූන, ඕජෝගුණ සමන්විත, සාලංකෘත භාෂාත්මක වර්ණනයන්ට ද යොමු වී ඇති බව පූර්වෝක්ත සෙල්ලිපි දෙස බැලීමෙන් සක් සුදක් සේ පැහැදිලි ය. ඒ අනුව සෙල්ලිපි යන වදන ඇසෙන විට ම එහි අන්තරගත වනුයේ කර්ණකඨෝර, සුබනම්‍ය නොවූ බස්වහරක්ය යන මතය මඳකට හෝ තුනී කිරීමට මෙම කාව්‍යාත්මක සෙල්ලිපි සමත් වන බව පෙනේ. එම නිසා නිසල රුදු ගල්කුළෙක ජනහද සසල කළ හැකි සුලලිත පදමාලාවක් ගැබ් ව තිබෙන බව ද අප අමතක නොකළ යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංශ හිමි, කේ., (1969). ලක්දිව සෙල්ලිපි. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

Codrington, H. W., Paranavitana, S., (ed.). (1934). Epigraphia Zeylanica. Vol-IV. Oxford University Press. London.

Paranavitana, S., (ed.). (1955). Epigraphia Zeylanica. Vol-V. Part - I. Government Press. Ceylon.

Paranavitana, S., Godakumbura, C. E., (ed.). (1963). Epigraphia Zeylanica. Vol-V. Part - II. Government Press. Ceylon.

Uduwara, J., (ed.). (1991). Epigraphia Zeylanica. Vol-VI. Part - II. Government Press. Sri Lanka.

Wickremasinghe, D. M. D. Z., (ed.). (1912). Epigraphia Zeylanica. Vol-I. Oxford University Press. London.

Wickremasinghe, D. M. D. Z., (ed.). (1928). Epigraphia Zeylanica. Vol-II. Oxford University Press. London.

විමලකිත්ති හිමි, එම්., (1957). ශිලාලේඛන සංග්‍රහය. (4 කොටස). ඩී. පී. දොඩන්ගොඩ සහ සමාගම. මොරටුව.

විමලකිත්ති හිමි, එම්., (1959). ශිලාලේඛන සංග්‍රහය. (5 කොටස). ඩී. පී. දොඩන්ගොඩ සහ සමාගම. මොරටුව.